**ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 209 - ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

-----------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.15 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබූ බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබුණි. | 2.1.1 |
| | | 2. ලේඛන හා පොත් පවත්වා නොතිබීම. | 2.11 |
| | | 3. අභ්‍යන්තර විගණනයේ වූ අඩුපාඩු. | 2.13 |
| | | 4. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.1.2 |
| | | 5. කළමනාකරණ දුර්වලතා | 2.6 |
| | | 6. සලසා තිබූ ප්‍රතිපාදන උපයෝජනයට නොගැනීම/ අධි ප්‍රතිපාදනය | 2.7 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම. | 2.11 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඊ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම | 2.8 |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිලධාරීන් එවකට වලංගු නීතිය හා නියමයන් අනුව ඇප තබන බව. | අදාළ නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.15 |
| 128(1) (ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව<br>(වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | පාඩු හා හානි | 2.4 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

### 2.1 කාර්යසාධනය

----------------

#### 2.1.1 සැලැසුම් කිරිම

----------------

2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සේවයේ යෙදී සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැසුම (Activity Plan), ක්‍රියාත්මක කළ කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

(ඇ) වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම (Imprest Requirement Plan) ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කර නොතිබුණි .

#### 2.1.2 කාර්යයභාරයන් ඉටු නොකිරීම

------------------------------

**(අ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

---------------------------------------------------------------

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පැරණි ගොඩනැගිලේ සම්පූර්ණ විදුලි පරිපථ පද්ධතිය නවීකරණය කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 29 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. ඒ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ ඇස්තමේන්තුව රු.13,598,750 ක් වූ අතර එම වටිනාකමින් රු.5,608,059 ක් සඳහා වූ චෙක්පත 2016 දෙසැම්බර් 31 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණි. මුදල් නිදහස් කර මාස 21 ක් ගත වුවද 2018 ඔක්තෝබර් 10 දින වන විටත් විදුලි පරිපථ නවීකරණ කටයුතු ආරම්භ කිරීමට හෝ මුදල් ආපසු ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ගොඩනැගිල්ලේ සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදුකළ යුතුව තිබියදී විදුලි පරිපථ නවීකරණ කටයුතු සඳහා පමණක් මුදල් ගෙවීම මෙම ප්‍රමාදයට හේතුවී තිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය.

#### 2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

------------------------------

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 2.1.4 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(i) කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යවශ්‍ය වුවත්, දෙපාර්තමේන්තුව විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන්හි ළඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් පවත්වා ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සූදානම් වීමේදී වෙනත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සැපයීම් හා සේවා ලබා ගැනීම

දෙපාර්තමේන්තුව විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබාගත යුතු වූ රු. මිලියන 27.7 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු.මිලියන 10 ක් ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 17.7 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණු අතර එය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 64 ක් විය.

### 2.3 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වත්කම් ලේඛනගත කිරීම**

දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ දරා ඇති මූලධන වියදම් රු.121,700,729 න් විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ දක්වා ඇත්තේ රු.7,523,104 ක් පමණි. ඒ අනුව ඩී.ජී.එස්.ඒ. 4 ඇමුණුමෙහි පෙන්නුම් කරන අගයන් හා ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාවේ සඳහන් අගයන් අතර රු.114,177,625 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ආ) වාහන උපයෝජනය**

**ඉන්ධන දහනයවීම් පරීක්ෂා නොකිරීම**

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව සියලුම වාහනවල ඉන්ධන දහනය වීම් පරීක්ෂා කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.

**(ඇ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(i) රත්නපුර උප කාර්යාලය වෙනුවෙන් 2015 දෙසැම්බර් මස රු. 2,927,481 ක් වටිනා වානේ රාක්ක සහ උපාංග මිලදී ගෙන තිබූ නමුත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් යෝජිත කාර්යාල ගොඩනැගිල්ල අත්පත් කරගැනීමට නොහැකිවීම නිසා 2018 ඔක්තෝබර් මාසය වන විටත් මෙම උපකරණ ප්‍රයෝජනය ගැනීමෙන් තොරව පැවතුණි.

(ii) දෙපාර්තමේන්තුවේ නීතිමය තැන්පතු අංශය සඳහා 2015 වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 2,459,553 ක් වටිනා රාක්ක සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා රු.975,168 ක උපාංග අදාළ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණු අතර 2018 ඔක්තෝබර් වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි.

(iii) 2014 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් රු.14,853,858 ක මුදලක් වැය කර ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ආපන ශාලාව ඉදිකර ඇතත් එහි වහලය නිසි ප්‍රමිතියකින් ඉදි කර නොතිබුණු අතර සහ සුළං කවුළු සහිත බිත්ති වෙනුවට ඉටි ආවරණ යොදා තිබුණි. මේ හේතුවෙන් වැසි ජලය ආපනශාලාව තුළට ගලා ඒම නිසා ආපනශාලාව විවෘත කර මාස 18 කින් වසා දැමීමට සිදු වී තිබුණි. 2016 මැයි මස වසා දමන ලද මෙම ආපන ශාලාවේ අඩුපාඩු සකස් කර ගැනීමට සැලසුම් කර තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම සැලසුම් ක්‍රියාත්මක කර නොතිබුණි.

**2.4 පාඩු හා හානි**

2012 වර්ෂයේ ඉදිකරන ලද නව ගොඩනැගිලි පරිශ්‍රයේ මහල් හතරෙහිම පැවති විශාල ප්‍රමාණයේ විහිදුණු ඉරිතැලීම් එම වර්ෂයේදීම පිළිසකර කර තිබුණද, ඉදිකර වසර 05 ක් වැනි කෙටි කාලයක් තුළ මෙලෙස ඉරිතැලීම් සිදුවීම අසාමාන්‍ය කරුණක් ලෙස නිරීක්ෂණය විය. තවද මෙම නව ගොඩනැගිල්ලේ දෙවන, තුන්වන හා සිවුවන මහල් සඳහා ජංගම රාක්ක පද්ධතිය (Mobile Racking System) ස්ථාපිත කළ පසු හා ඒ මත විශාල ලිපි ලේඛන ප්‍රමාණයක් තැන්පත් කිරීමත් සමග ගොඩනැගිල්ලේ මෙම ඉරිතැලීම් තවදුරටත් ව්‍යාප්ත වී අනතුරුදායක තත්වයක් ඇති විය හැකි බව නිරීක්ෂණය විය.

**2.5 විසඳා නොතිබුණු විගණන ඡේද**

දෙපාර්තමේන්තුවට අදාළව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව<br>ඡේද අංකය | යොමුගත විෂයය |
|---|---|
| 3.2 | රු.මිලියන15.7 කට මිලදී ගත් සිතියම් පරිලෝකන යන්ත්‍රයට අදාළව නිෂ්පාදකයාගේ බලය පැවරීමේ ලිපියේ මුල් පිටපත, වසර 3 ක කාලයක් සඳහා වූ වගකීම් සහතිකය හා නිෂ්පාදිත වර්ෂය සනාථ කෙරෙන ලියවිලි යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම. |

3.14 (ආ) ආපන ශාලාව දීර්ඝ කාලයක් තිස්සේ වසා දැමීම හේතුවෙන් 118 දෙනෙකුගෙන් සමන්විත වූ කාර්යය මණ්ඩලයට ආහාර ගැනීමට සුදුසු ස්ථානයක් නොමැති වීම.

## 2.6 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) නීතිමය තැන්පතු කෝෂ්ඨාගාරය ස්ථාපිත කර ඇති මහල් 6 කින් යුක්ත පරණ ගොඩනැගිල්ලේ දෙවන මහළ ස්ථාන කිහිපයකින් වැසි ජලය කාන්දු වෙමින් පවතී. වැසි ජලය නිසා තෙතමනය රඳා පැවතීමෙන් ලේඛන විනාශ වීමට ඉඩකඩ පවතින බවත්, ගොඩනැගිල්ලේ පැවැත්මට මෙන්ම ජීවිත අවදානමකටද එය හේතු විය හැකි බවත් නිරීක්ෂණය විය. මෙම අවදානම වර්ෂ කීපයක සිට පැවතියද එම තත්වය වැළැක්වීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ජංගම රාක්ක සවිකිරීමේ රු.මිලියන 169 ක කොන්ත්‍රාත්තුව සඳහා වූ ගිවිසුමේ අංක 26 (1) දරන කොන්දේසිය අනුව 2016 දෙසැම්බර් 26 දිනට පෙර වැඩ නිම කළ යුතු වුවත් එසේ සිදු නොවීම නිසා 2017 මාර්තු මස දෙවැනි සතිය දක්වා එම කාලය දීර්ඝ කර තිබුණි. එසේ වුවද වැඩ නිමකර භාරදී තිබුණේ 2017 සැප්තැම්බර් 15 දින වුවත් ගිවිසුමට අනුව අයකර ගතයුතු ප්‍රමාද ගාස්තුව වූ රු. මිලියන 16.9 ක මුදල අයකර නොතිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

----------------------------------------------------------------------------------------------------

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| **වර්ෂය** | **වියදම් වර්ගය** | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|---|
| | | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| 2013 | පුනරාවර්තන | 81.9 | 77.4 | 4.5 | 5.49 |
| | මූලධන | 294.2 | 67.5 | 226.7 | 77.06 |
| | **එකතුව** | **376.1** | **144.9** | **231.2** | **61.47** |
| 2014 | පුනරාවර්තන | 93.8 | 90.2 | 3.6 | 3.84 |
| | මූලධන | 77.2 | 75.7 | 1.5 | 1.94 |
| | **එකතුව** | **171.0** | **165.9** | **5.1** | **2.98** |
| 2015 | පුනරාවර්තන | 109.8 | 98.7 | 11.1 | 10.11 |
| | මූලධන | 176.4 | 35.5 | 140.9 | 79.88 |
| | **එකතුව** | **286.2** | **134.2** | **152.0** | **53.11** |
| 2016 | පුනරාවර්තන | 112.1 | 104.7 | 7.4 | 6.60 |
| | මූලධන | 220.8 | 95.3 | 125.5 | 56.84 |
| | **එකතුව** | **332.9** | **200.0** | **132.9** | **39.92** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2017 | පුනරාවර්තන | 113.9 | 97.7 | 16.2 | 14.22 |
| | මූලධන | 247.8 | 121.7 | 126.1 | 50.89 |
| | **එකතුව** | **361.7** | **219.4** | **142.3** | **39.34** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විසර්ජන ගිණුම**

**----------------**

පහත සඳහන් කිරික්ෂණයන් කරනු ලැබේ.

**(i) සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

**---------------------------------------------------**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 361.7 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 219.4 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 142.3 ක් හෙවත් සියයට 39 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ii) පුනරාවර්තන අධි ප්‍රතිපාදන**

**----------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා පුනරාවර්තන වැය විෂයයන් 13 ක් සඳහා එකතුව රු.මිලියන 32.02 ක ශුද්ධ ප්‍රතිපාදන තිබීම හේතුවෙන් එම වැය විෂයයන් සඳහා රු.මිලියන 20.87 ක් උපයෝජනය කළ පසු රු.මිලියන 11.14 ක් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. ඒ අනුව, වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**(iii) මූලධන අධි ප්‍රතිපාදන**

**----------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූලධන වැය විෂයයන් 13 ක් සඳහා එකතුව රු.මිලියන 237.40 ක ශුද්ධ ප්‍රතිපාදන තිබීම හේතුවෙන් එම වැය විෂයයන් සඳහා රු.මිලියන 111.97 ක් උපයෝජනය කළ පසු රු.මිලියන 125.43 ක් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. ඒ අනුව, වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 25 සිට සියයට 100 දක්වා වූ පරාසයක ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**----------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| -------- | | --------- | | -------------- | |
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| ------------- | ---------- | ----------- | ---------- | ----------- | --------- |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 7.00 | 6.54 | 3.50 | 3.52 | 25.00 | 18.30 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම**

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු. 415,833 ක් වූ අතර එම හිඟහිටි ශේෂ වර්ෂ 5 කට වැඩි කාලය සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

## 2.9 පොදු තැන්පත් ගිණුම

(අ) දෙපාර්තමේන්තු ගිණුම් පොත්, භාණ්ඩාගාර පොත් හා සැසඳීමට මු.රෙ 427 හි විධි විධාන පරිදි සැසඳීම් ප්‍රකාශයක් පිළියෙල කළයුතු වුවත් පොදු තැන්පත් ගිණුම සම්බන්ධව එවැනි සැසඳීම් ප්‍රකාශයක් පිළියෙළ කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තු පොත් අනුව 2017 දෙසැම්බර් 31 දිනට අංක 6000/0000/00/0015/0091/000 දරන පොදු තැන්පත් ගිණුමේ අවසාන ශේෂයක් නොතිබුණ ද භාණ්ඩාගාර අවසාන පරිගණක සටහන පරිදි එදිනට එම ගිණුමේ රු.742,282 ක සෘණ ශේෂයක් සහ වර්ෂය තුළ හර කිරීම් රු.10,000 ක් පවතින බව නිරීක්ෂණය විය. මෙම වෙනස්කම් පිළිබඳ සැසඳීමක් සිදු කර නොතිබුණි.

## 2.10 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**ගැලපුම් කළයුතු ශේෂ**

දෙපාර්තමේන්තුව විසින් 2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බැංකු ගිණුමට අදාළව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2017 දෙසැම්බර් 31 දිනට සකස්කළ බැංකු සැසඳුමේ ඇතුළත් හඳුනා නොගත් ගෙවීම් වල වටිනාකම රු. 281,309 ක් වූ අතර හඳුනා නොගත් ලැබීම් වල වටිනාකම රු. 273,310 ක් විය.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට සකස් කළ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ 2014 දෙසැම්බර් 31 දින සිට පැවත එන රු.88,500 ක තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පතක් කිසිදු විමර්ශනයකින් තොරව ඉදිරියට ගෙන යමින් තිබුණි.

**2.11 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය. | පවත්වා නොතිබුණි. |
| (ආ) | හානි පාඩු ලේඛනය | මුදල් රෙගුලාසි 110 | පවත්වා නොතිබුණි. |
| (ඇ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ඈ) | බඩු වට්ටෝරු ලේඛනය | මුදල් රෙගුලාසි 454(1) | විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

**2.12 අනුකූල නොවීම්**

**බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.12 වගන්තිය ප්‍රකාරව 2017 වර්ෂයට අදාළව එකතු කළ අගය මත බද්ධ (VAT) ආවරණය සඳහා මුදල් ගෙවීමෙන් පසු ඊළඟ මාසයේ 15 වන දිනට පෙර එකී ගෙවීම් පිළිබඳව දේශීය ආදායම් කොමසාරිස්වරයා වෙත දැනුම් දී නොතිබුණි.

**2.13 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණද මුදල් රෙගුලාසි 133 අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**2.14 මානව සම්පත් කළමනාකරණය**

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 57 ක් පමණ වැය කර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.485,855 ක් වී තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 03 | 13 |
| (ii) | තෘතියික මට්ටම | 27 | 11 | 16 |
| (iii) | ද්විතියික මට්ටම | 163 | 56 | 107 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 86 | 48 | 38 |
| | | 292 | 118 | 174 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා අනුමත 292 ක් වූ කාර්යය මණ්ඩලයෙන් තනතුරු 174 ක් ම පුරප්පාඩුව පැවති අතර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 43 න් 29 ක්ම පුරප්පාඩුව පැවතීම ආයතනයේ කාර්යයසාධනය පහත වැටීමට හේතු විය හැකි බව නිරීක්ෂණය විය.

## 2.15 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධි විධාන ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.